1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/8/8/3 2025 | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2025.05. 27 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්,

සභා ලේකම්,

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු/නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් වෙත.

**<u>අත්තිකාරම් ගිණුම් කටයුතුවල සීමා සංශෝධන සම්බන්ධවයි</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳ දකුණු පළාත් මුදල් රීති 365 සිට 383 දක්වා මුදල් රීති හා 2025.05.09 දිනැතිව හා අංක 12/2025 යටතේ රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අත්සන සහිතව යොමු කරන ලද චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

03.ඒ අනුව රාජ්‍ය සේවකයන් සඳහා මෙතෙක් අපදා ණය ලබා දීමේ උපරිම සීමාව රු.250,000.00 සිට රු.400,000.00 දක්වා ඉහළ නැංවීමට රජය තීරණය කර ඇත.ඒම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාල කර ගැනිම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලිපි අංක GS/SP/EST/1/1/01 I සහ 2025.05.17 දිනැතිව ලැබී ඇත.

04.ඒ අනුව 2025 වර්ෂය සඳහා ඔබගේ අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් බී ගිණුමෙහි සීමාවන් සංශෝධනය කිරිමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා වන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද ඉල්ලුම් පත්‍ර 2025.06.15 දිනට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

05.ආදර්ශ ආකෘති පත්‍ර www.cs.sp.gov.lk වෙබ් අඩවියට පිවිසිමෙන්ද බාගත කරගත හැකිය.

06.මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

සුමිත් අලහකෝන්

ප්‍රධාන ලේකම්

දකුණු පළාත.

විද්‍යුත් ලිපිනය:budget@cs.sp.gov.lk දුරකථන අංකය: 091-2246902 ෆැක්ස්: 091-2246902